චක්‍රලේඛ අංක :- 04/2020

මගේ අංකය / எனது இல. / My No. } RG/MBD/1/ චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. } 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. } 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail } rgd@sltnet.lk, rg@rgd.gov.lk

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site } www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.

දිනය / திகதி / Date: 2020.05.22

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මාස 03ක් ඇතුළත ලියාපදිංචි කර ගැනීමට නොහැකි වූ</u> උපත් ලියාපදිංචි කිරීම සඳහා පහසු ක්‍රමවේදයක් හඳුන්වා දීම.**

කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය රාජකාරි කටයුතුවලින් බැහැරවීමට සිදු වීම හේතුවෙන් උපත් නිසි කාලසීමාව තුළ දී ලියාපදිංචි කර ගැනීමට නොහැකි වී ඇති බව මා වෙත වාර්තා වී ඇත.

02. එබැවින් මෙම වසංගත තත්වය හේතුවෙන් 2019.12.15 දිනට පසුව සිදු වූ උපතක් මුල් මාස තුනක කාලසීමාව තුළ දී ලියාපදිංචි කර ගැනීමට අපොහොසත් වී ඇති අය, උප්පැන්න මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 24 වගන්තිය මත ප්‍රකාශ පත්‍රයක් මඟින් කල්ගත වූ උපතක් ලියාපදිංචි කර ගැනීමට ඉල්ලුම් කිරීමේ දී පහත සඳහන් අත්‍යවශ්‍ය ලියවිලි පමණක් ලබා ගෙන එමගින් උපත තහවුරු කරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

I. 24 වගන්තිය යටතේ වූ ප්‍රකාශ පත්‍රය (ලි.ප.බී. 6 හා CR 1 පෝරමය)
II. දෙමාපියන් විවාහක නම් ඔවුන්ගේ විවාහ සහතිකයේ පිටපතක් (ඡායා පිටපතක් වුව ද ප්‍රමාණවත් වේ.)
III. දෙමාපියන්ගේ උප්පැන්න සහතිකවල පිටපතක් (ඡායා පිටපතක් වුව ද ප්‍රමාණවත් වේ.)
IV. උපන් දිනය හා ස්ථානය සනාථ කර ගැනීම සඳහා පහත ලියවිලිවලින් <u>එකක්</u> පමණක්,
    - රෝහල් උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්
    - ග්‍රාම නිලධාරි වාර්තාව හෝ එහි සහතික පිටපතක්
    - වතු උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්
    - පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ සහතිකය

03. ඒ අනුව ඉහත ලියවිලි මත පදනම් වෙමින් ගෝලීය කොවිඩ් 19 වෛරස වසංගත තත්ත්වය හේතුවෙන් මෙම උපත මාස තුනක් ඇතුළත ලියාපදිංචි කර ගැනීමට නොහැකි වී ඇති බව සනාථ වන්නේ නම් 24 වගන්තිය යටතේ කල්ගත වූ උපතක් ලෙස ලියාපදිංචි කර දීමට අවශ්‍ය නියෝගය ලබා දෙන මෙන් දන්වමි.

04. තව ද මේ යටතේ කටයුතු කිරීමේ දී ග්‍රාම නිලධාරි වාර්තා වැනි අත්‍යවශ්‍ය නොවන ලියවිලි ඉල්ලා නොසිටින ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එන්.සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්

එන්. සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

පිටපත්:-

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. - දැනගැනීම සඳහා
2. සියළුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහා
3. සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා
4. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරින් වෙත - දැනගැනීම සඳහා
5. මධ්‍යම ලේඛනාගාරයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - දැනගැනීම සඳහා
6. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැනගැනීම සඳහා